වගා ආධාර චක්‍රලේඛ අංක: 16

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 349, ගාලු පාර,
කොළඹ 03.
1989. 02. . 14 . දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව: **තේ ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් පරීක්ෂා කිරීම.**

## 1.0 පරමාර්ථය:

අලුතින් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ තේ වවන සියලු ඉඩම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි කිරීම සඳහා අධිකාරියේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් පරීක්ෂා කොට වාර්තා කිරීම මෙතෙක් පැවති ක්‍රියා මාර්ගය වේ.

සහනාධාර ගෙවීම් වාරික ගණන අඩුකිරීම, ඉඩම් හිමිකම් සහතික පරීක්ෂා නොකිරීම වැනි හේතූන් නිසා අධිකාරිය මගින් තවදුරටත් මෙම පරීක්ෂණය පැවැත්වීම ප්‍රායෝගික නොවන බැවින්ද, ඒ සඳහා ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය බැවින්ද, අධිකාරිය මගින් එම පරීක්ෂණ පැවැත්වීම නතර කිරීම මෙහි පරමාර්ථයයි.

## 2.0 ක්‍රියා මාර්ගය:

2:1 තේ වගා සහනාධාර අවසර පත්‍ර යටතේ වගා කරන ලද ඉඩම් ඇතුලුව අලුතෙන් වගා කරන ලද සියලුම තේ ඉඩම් තේ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරීම පිණිස අධිකාරිය මගින් පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම තේ කොමසාරිස්ගේද එකඟත්වය ඇතිව වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කිරීමට තීරණය කර ඇත. ඒ අනුව මෙහි පහත දැක්වෙන ආකාරයට ඒ පිළිබඳව කටයුතු කරන්න.

2:2 දැනටමත් එවැනි පරීක්ෂණ කරන ලද ඉඩම් සම්බන්ධයෙන් පමණක් අදාළ 'ඩී' ආකෘති වාර්තා ප්‍රාදේශීය කාර්යාල මගින් තේ කොමසාරිස් වෙත යවන්න.

2:3 අධිකාරියෙන් සහනාධාර ලබා අලුතෙන් තේ වගා කරන ලද ඉඩම්වලට අවසාන වාරිකය ගෙවනු ලබන අවස්ථාවේදී ඉඩම පිළිබඳ තොරතුරු අංක 1 ඇමුණුම පරිදි මාසිකව තේ කොමසාරිස් වෙත අත්වන්න.

.... 2 පිටුව

2:4 (අ) අවසාන ගෙවීම් කරන අවස්ථාවේදී මින් ඉදිරියට ටීසී.2 ආකෘතිය ඉල්ලුම්කරු වෙත යැවීමට අවශ්‍ය නො වේ.

(ආ) දැනටමත් ඔබ කා ර්යාලයේ ඇති භාවිත නොකළ ටීසී.2 සහ 'ඩී' ආකෘති ඇත්නම් ඒවා ප්‍රදේශයේ සහකා ර තේ කොමසාරිස් වෙත භාරදී ඒ බව තේ කො මසාරිස් වෙත පිටපතක් සහිතව මා වෙත දැනුම් දෙන්න.

2:5 මෙම කරුණ සම්බන්ධයෙන් මීට ඉහතින් උපදෙස් දී ඇති අංක ඩීජීටී/19/ටීඇඩී හා 1985.02.14 දිනැති චක්‍රලේඛය මේ අනුව අවලංගු කරනු ලැබේ.

සභාපති.

පිටපත්:
1. ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
2. තේ කොමසාරිස්.
3. සාමාන්‍යාධිකා රී - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය.
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
4. සහකා ර සාමාන්‍යාධිකා රී (මුදල්)
5. අභ්‍යන්තර විගණක.
6. ක්‍රම සම්පාදන නිලධාරී.
7. ගණකාධිකා රී (සහනාධාර)
8. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
9. සංඛ්‍යා ලේඛණ නිලධාරී.
10. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
11. අලුත් වගා අංශ ප්‍රධානීන්.

---

ඇමුණුම 1.

තේ කොමසාරිස්,
තො ළඹ.

අලුතෙන් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ
තේ වගා කරන ලද ඉඩම් පිළිබඳ ප්‍රත්‍යාය.

යථෝක්ත ආධාර ක්‍රමය යටතේ අලුතෙන් තේ වගා කොට අවසාන වාරිකය වශයෙන් 19............... මාසය තුළදී තේ වගා කිරීමෙන් අවුරුද්දකට පසු ගෙවීම සම්පූර්ණ කරන ලද තේ ඉඩම් පිළිබඳ තො රතුරු පහත දැක්වේ.

| අවසර පත්‍ර අංකය | ඉඩා මි නම | ඉඩමේ පිහිටීම දිස්ත්‍රික්කය, ප්‍රා. ද. කොට්ඨාසය, ග්‍රා. සේ. කොට්ඨාසය සහ ගම | අවසර පත්‍ර හිමිකරුගේ නම සහ ලිපිනය | තේ වගා කරන ලද බිම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | | | |

දිනය:

ප්‍රාදේශීය කළමනාකරු.